**ශීර්ෂය 307 - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

**----------------------------------------------------------**

**1.** **මූල්‍ය ප්‍රකාශන**

-----------------

**1.1** **තත්ත්වාගණනය කළ මතය**

**--------------------------------**

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 26 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 18 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**---------------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.

- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබූ බව.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

----------------------------------------

**1.6.1 මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ)** මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව ගිණුම් විෂයයන් 07ක ශේෂ, ඊට අදාළ උපලේඛන හා සැසඳීමේ දී රු.2,172,994 ක වෙනසක් පැවැතුණි. | උපලේඛනවල ශේෂ, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ අදාළ ශේෂ සමග එකඟ විය යුතු වීම. | මුදල් ප්‍රවාහය ගණනයට ඍජු ක්‍රමවේදයක් නොතිබුණි. යම් යම් උපකල්පන මත එය සකස් කළ නිසා සැබෑ මුදල් ප්‍රවාහය පිළිබිඹු නොවන්නට ඇති බව පිළිගනිමි. |

| | | |
|---|---|---|
| **(ආ)** සමාලෝචිත වර්ෂය තුළ මුදලින් ලද රු.1,859,524,152ක සුඛෝපභෝගී වාහන බදු, මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගෙන නොතිබුණි. | සියලු මුදල් ලැබීම්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අදාළ කරගත යුතු වීම. | දෙපාර්තමේන්තුවේ බැංකු ගිණුමට බැර නොවන මුදලක් නිසා එය ලැබීම් ලෙස හඳුනා නොගන්නා ලදී. |

**1.6.2** **අග්‍රිම ගැලපුම් ගිණුම**

-----------------------

අග්‍රිම ගිණුමේ වූ වෙනස නිරවුල් කිරීමට සකස් කර තිබුණු ගැලපුම් ගිණුමේ පහත අඩුලුහුඬුකම් පැවතිණි.

| විගණන නිරික්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ)** | අග්‍රිම ගැලපුම් ගිණුමේ වූ රු.286,438,141 ක වටිනාකමක් ගණනය කළ ආකාරය පිළිබඳ විස්තරාත්මක තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි. | ගනුදෙනු සඳහා විශ්ලේෂණ ඉදිරිපත් කිරීම කළ යුතු වීම. | පිළිතුරු ලබා දී නොතිබුණි. |
| **(ආ)** | වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් රැස්කළ ආදායම පමණක් ගැලපුම් ගිණුමට හර කළ යුතු වුවත්, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු විසින් 2019 වර්ෂය තුළ රැස් කළ රු.62,495,420 ක කාබන් බදු මුදලක් ද අග්‍රිම ගැලපුම් ගිණුමට හරකර තිබුණි. | ගැලපුම් ගිණුමට අදාළ වන සංඛ්‍යා පමණක් ගැලපුම් කළ යුතු වීම. | මෙම මුදල ගැලපුම් ගිණුමේ දැක්වීම නිවැරදි නොවන බව පිළිගනිමි. |

### 1.6.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන් දීමේ නිලධාරීන් විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| | නිරීක්ෂණය | නිර්දේශය | දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | පිළිතුරු ලබා දී නොතිබුණි. |
| (ආ) | විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාල සීමාවන් තුළ සියලුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදුවන බව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.3. ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | පිළිතුරු ලබා දී නොතිබුණි. |

### 1.6.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

---

නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | | | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| **(අ)** | **මෝටර් වාහන පනත (203 වන අධිකාරය)** | | | | |
| | (i) | 6(අ) වගන්තිය | ලියාපදිංචි මෝටර් වාහනවල විස්තර ඇතුළත් ලේඛනයක් පවත්වා නොතිබුණි. | පනත අනුව කටයුතු කිරීම. | පිළිතුරු ලබා දී නොතිබුණි. |
| | (ii) | 08 වන වගන්තිය | නියමිත ගාස්තුව ගෙවීමට පෙර මෝටර් වාහන ලියාපදිංචි කළ අවස්ථා පැවැතිණි. | පනත අනුව කටයුතු කිරීම. | අයදුම්පත අත්සන් කළ දිනය ලියාපදිංචි දිනය වේ. |
| | (iii) | 18 (8) (අ) වන වගන්තිය | අවලංගු කරන ලද වාහන සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වා නොතිබුණි. | පනත අනුව කටයුතු කිරීම. | පිළිතුරු ලබා දී නොතිබුණි. |
| (ආ) | 1973 අංක 48 දරන ජාතික ලේඛනාරක්ෂක නීතියේ 28 වැනි වගන්තිය සහ ආයතන සංග්‍රහයේ XXVIII වැනි පරිච්ඡේදයේ 9(1) උප වගන්තිය | | වාහන ලිපිගොනුවල භාරකාරත්වය නිලධාරීන් වෙත පවරා නොතිබුණි. මේ හේතුවෙන් වේරහැර පරිශ්‍රයේ බහාලුම් තුළ විනාශ වෙමින් පවතින වාහන ලිපිගොනුවල තොරතුරු ලේඛනගත | අදාළ නීතිරීති පරිදි කටයුතු කිරීම. | පිළිතුරු ලබා දී නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | කිරීමේ අවශ්‍යතාවක් ද පැවතිණි. | | |
| (ඇ) | අංක 5/2007 දරන 2007 සැප්තැම්බර් 05 දිනැති භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛය | බැංකු ජංගම ගිණුමක් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | හෙළිදරව් කළ යුතු යැයි නෛතිකව දක්වා ඇති ගනුදෙනු හෙළිදරව් කළ යුතු වීම. | එම තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල දක්වන ලෙස නිලධාරීන්ට උපදෙස් දී ඇත. |
| (ඇ) | අංක 01/2015 දරන 2015 ජූලි 20 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 04 (ආ) ඡේදය | හිඟ ආදායම් ඇති නොවීමට පියවර ගෙන නොතිබුණි. ඒ හේතුවෙන් 2016 වර්ෂයට අනුව 2019 වර්ෂයේ හිඟ ආදායම වැඩි වීම සියයට 208 ක් විය. | නීතිරීති අනුව වාර්තා පවත්වා ගත යුතු වීම හා හිඟ ආදායම් අයකර ගැනීම කඩිනම් කිරීම. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කෙරේ. වාහනගහනය වැඩි වීම ද මීට හේතු වී ඇත. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 ආදායම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සුඛෝපභෝගී මෝටර් වාහන බදු සඳහා හිඟ ආදායම් වාර්තා සකස් නොකිරීම නිසා 1995 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලයට අදාළ හිඟ ආදායම් ලැබීම් අවිනිශ්චිත තත්ත්වයක පැවති බව නිරීක්ෂණය විය. | හිඟ ආදායම් ගණනය කර අදාළ වාර්තා පිළියෙල කිරීම. | එම වාර්තා සකස් කිරීමට උපදෙස් දෙන ලදී. |

## 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වැය විෂයයන් 06ක ප්‍රතිපාදනවලින් සියයට 35 සිට සියයට 100 දක්වා පරාසයක ඉතිරිවීම් පැවැතිණි. එමෙන්ම එක් වැය විෂයකට පරිපූරක ඇස්තමේන්තුවකින් ලද රු.5,200,000 ක මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | නිසි ලෙස ඇස්තමේන්තු සකස් කිරීම. | විගණන නිරීක්ෂණ හා එකඟ වේ. |
| (ආ) වැය විෂයක ඇස්තමේන්තුගත වටිනාකමින් සියයට 98ක් හෙවත් රු.214,800,000ක් වෙනත් වැය විෂයයන් වෙත මාරුකර තිබුණි. | ඇස්තමේන්තු තාත්විකව සැකසීම | විගණන නිරීක්ෂණ හා එකඟ වේ. |
| (ඇ) අංක 5/2019 හා 2019 සැප්තැම්බර් 24 දිනැති ජාතික අයවැය චක්‍රලේඛය අනුව, මූලධන වියදම්වලින් සියයට 25ක් අඩුකළ පසුව ද, වැය විෂයයන් 07ක ඉතිරිවූ ප්‍රතිපාදනය සියයට 37ත් සියයට 100ත් අතර පරාසයක විය. | තාත්වික ලෙස ඇස්තමේන්තු සකස් කිරීම. | විගණන නිරීක්ෂණ හා එකඟ වේ. |

## 2.3 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මිය ගොස් වර්ෂ 05 ඉක්මවූ එකතුව රු.727,523 ක ණය ශේෂ නිරවුල් කර නොතිබුණි. | ශේෂ අප්‍රමාදව නිරවුල් කිරීම. | තොරතුරු සෙවීම සිදු කෙරේ. |

| | | | |
|---|---|---|---|
| **(ආ)** | ස්ථාන මාරු වී ගිය නමුත් වර්ෂ 05 ඉක්මවූ නිරවුල් නොකළ රු.**226,230** ක ණය ශේෂ 04 ක් විය. | ශේෂ අප්‍රමාදව නිරවුල් කිරීම. | තොරතුරු සෙවීම සිදු කෙරේ. |
| **(ඇ)** | වැඩ තහනම් වූ නිලධාරීන්ගෙන් අයවිය යුතු වර්ෂ 02 ඉක්මවූ රු. 1,330,463 ක ණය ශේෂ 19ක් තුළ වර්ෂ 05 ඉක්ම වූ රු1,170,753 ක ශේෂ 17ක් විය. | කල් ඉකුත් වී ඇති බැවින් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම. | පස් දෙනෙකුගේ විනය පරීක්ෂණ සිදු කෙරේ. |
| **(ඈ)** | සේවය අත්හැර ගිය නිලධාරීන් 07 දෙනෙකුගෙන් සහ විශ්‍රාම වැටුප් අත්හිටවූ නිලධාරීන් 07 දෙනෙකුගෙන් අයවිය යුතු පිළිවෙලින් රු. 234,042 ක හා රු.302,722 ක ණය ශේෂ වර්ෂ 05 කට වඩා පැරණි විය. | කල් ඉකුත් වී ඇති බැවින් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම. | එක් නිලධාරියෙකුට සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනේ. තොරතුරු සෙවීම සිදු කෙරේ. |
| **(ඉ)** | කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ 2019 දෙසැම්බර් 31 දිනට එකතුව හා එදිනට දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂය අතර රු. 2,359,113 ක වෙනසක් විය. | අදාළ ලේඛන, ප්‍රභව ලියවිලි සමග සසඳා ගිණුම්ගත කිරීම. | වඩාත් නිවැරදිව මෙම වසරේදී ලැයිස්තුගත කිරීම නිසා මෙම වෙනස ඇති වී තිබුණි. |

**2.4** **තැන්පතු ශේෂ**

**---------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| | ------------------------ | -------------- | --------------------------- |
| **(අ)** | වර්ෂ 02 ඉක්ම වූ රු.24,179,394 ක කොන්ත්‍රාත් රැඳවුම් ශේෂ 12 ක් වෙනුවෙන් මුදල් රෙගුලාසි 571 පරිදි කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව පියවර ගැනීම. | මේ සඳහා කමිටුවක් පත්කර වාර්තාවක් කැඳවීමට කටයුතු කර ඇත. |

| | | | |
|---|---|---|---|
| **(ආ)** | මු.රෙ.571 (1) පරිදි, අර්ධ වර්ෂ සඳහා කල් ඉකුත් වූ තැන්පතු පිළිබඳ ලැයිස්තු පිළියෙල කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කිරීම. | මෙම තැන්පතු මු.රෙ. 571 යටතට නොගැනෙන බැවින් වාර්තා පිළියෙල කර නැත. |
| **(ඇ)** | දිස්ත්‍රික් කාර්යාලවල වර්ෂය අවසානයට පැවැති රු.5,708,778 ක තැන්පතු සඳහා විශ්ලේෂණයක් නොතිබීම නිසා ඒවා කුමන කාර්යාලවල කෙතරම් පැරණි ශේෂ ද, යන්න තහවුරු නොවීය. | විශ්ලේෂණ සහිතව වාර්තා සකස් කිරීම. | අදාළ තැන්පතු ශේෂවල පවතින තොරතුරු දිස්ත්‍රික් ලේකම් කාර්යාල මගින් ලබා ගැනීමට කටයුතු කර ඇත. |
| **(ඈ)** | එළැඹෙන මාසයේ පළමු සතිය තුළ නිරවුල් කළ යුතු, බස්නාහිර හා ඌව පළාත් සභා වෙනුවෙන් 2019 නොවැම්බර් මස එකතු කළ රු. 57,640,136ක ආදායමක් අංක 01/2015 හා 2015 ජූලි 20 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 04 (ඈ) ඡේදයට පටහැනිව, පොදු තැන්පතු ගිණුමට ගෙන තිබුණි. | නීති,රීති හා රෙගුලාසි අනුව කටයුතු කිරීමට පියවර ගැනීම. | මෙම ආදායම **2020** ජනවාරි 07 දින අදාළ පළාත් සභා වෙත යවා ඇත. |

## 2.5 බැරකම් හා බැඳීම්වලට එළැඹීම

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| මුදල් රෙගුලාසි 94 (2) පටහැනිව, රු.16,260,062 ක මූලධන වියදම් වෙනුවෙන් වූ බැරකම් සඳහා බැඳී තිබුණි. | මුදල් රෙගුලාසි 94 (2) ප්‍රකාරව කටයුතු කළයුතු වීම. | පිළිතුරු ලබා දී නොතිබුණි. |

**2.6** **බැංකු ගිණුම් මෙහෙයවීම**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | ------------- | ---------------- |
| (අ) | 2019 දෙසැම්බර් 31 දිනට වූ බැංකු සැසඳුම් ප්‍රකාශනය අනුව, පිළිවෙලින් රු.1,089,884ක හා රු. 778,295ක හඳුනා නොගත් ගෙවීම් හා ලැබීම් පැවැතිණි. | ගනුදෙනු නිසි ලෙස හඳුනාගෙන ගිණුම්ගත කළයුතු වීම. | නිරවුල් කිරීමට කටයුතු කරමින් සිටී. |
| (ආ) | 2019 දෙසැම්බර් 31 දිනට මාස 06 ඉක්මවූ නිකුත් කළ චෙක්පත්වල වටිනාකම රු. 1,210,671ක් වූ අතර එතුල වර්ෂය ඉක්මවූ රු. 178,318ක චෙක්පත් විය. මෙම චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීම. | 2019 දෙසැම්බර් 31 දිනට මාස 06 ඉක්මවූ චෙක්පත් වටිනාකම රු. 305,510කි. |

**3** **මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1** **පාඩු හා හානි**

-------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | -------------- | ------------ |
| රක්ෂණ සමාගම් විසින් එක් මාසයක එකතු කළ සුඛෝපභෝගී වාහන බදු, ඊ ලඟ මාසයේ 15 දිනට පෙර දෙපාර්තමේන්තු ආදායමට බැර කළ යුතු බව 1995 අංක 16 දරන මුදල් පනතේ 08(1)(ආ) වගන්තියෙන් දක්වා තිබුණි. ඒ අනුව 2018 වර්ෂයේ මාස 06ක දී පමණක් එම සමාගම් විසින් දින 06ත් දින 43ත් | නීති සංශෝධනය පිළිබඳව සොයා බැලීම හා ප්‍රාදේශීය | පනතේ වූ මෙම ප්‍රතිපාදනය නිසා ඇතිවන තත්ත්වය |

| | | |
|---|---|---|
| අතර කාලය තුළ රු.264,099,500ක බදු මුදල් අත රඳවා ගෙන තිබුණි. ආදායම් බලපත්‍ර නිකුත් කිරීමේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් එම බදු අයකිරීම පිළිවඳව සොයාබලා ඇති බවක් නිරීක්ෂණය නොවීය. තවද, මෙම බදු අය කිරීම 2026 මාර්තු 05 දක්වා රක්ෂණ සමාගම් විසින් සිදු කිරීමට නියමිත බවද නිරීක්ෂණය විය. | ලේකම් කාර්යාල සමඟ එකඟතාවකට පැමිණීම. | පිළිබඳ නිශ්චිතව පිළිතුරු ලබා දී නොතිබුණි. |

**3.2 මෙහෙයුම් දුර්වලතා**

---------------------

**3.2.1 වාහන අංක තහඩු මුද්‍රණය**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ) වාහන අංක තහඩුවක් නිෂ්පාදනය කිරීම සඳහා දරනු ලබන ආනයනික පිරිවැය හා දේශීය වශයෙන් දරනු ලබන පිරිවැය යන දෙකේ එකතුව සහ වත්මන් සැපයුම්කරුට ගෙවන මිල අතර වෙනස සලකා වඩාත් වාසිදායක විකල්පය තීරණය කිරීම වෙනුවට 2019 සැප්තැම්බර් 10 දින පූර්ව සැපයුම්කරු වෙත ම නව ප්‍රසම්පාදනය පිරිනමා තිබුණි. | තහඩු මුද්‍රණය සඳහා විකල්ප ක්‍රම සොයා බැලීම. | පිළිතුරු දී නොතිබුණි. |
| (ආ) මෙම කාර්ය සඳහා 1999 ඔක්තෝබර් මාසයේදී පූර්ව සැපයුම්කරු සමඟ ගිවිසුම්ගත වී 2000 මැයි මාසයේ සිට කොන්ත්‍රාත් කටයුතු ආරම්භ කර තිබුණි. එහෙත්, එම සමාගමට සිදු වූ ඇ.ඩො. 9,068,145ක අලාභයක් පියවීමට කාලයක් ගත වීම හා නව ප්‍රසම්පාදනය නිසි පරිදි ඉටු නොකිරීම නිසා වරින්වර ගිවිසුම්ගත කාලය දීර්ඝ කරමින් 2010 අප්‍රේල් මාසය දක්වා පැවැති ටෙන්ඩරය වර්ෂ 10ක් ඉදිරියට ගෙනැවිත් තිබුණි. ඉන්පසු නව ටෙන්ඩරය ද එම සමාගමටම ලැබී තිබුණු අතර එම ගිවිසුම් කාලය 2015 අප්‍රේල් මාසයේ අවසන් වී තිබුණි. | ප්‍රසම්පාදන කටයුතු කිසියම් කාල රාමුවකට අනුව ඉටු කිරීම. | පිළිතුරු දී නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| | පසුව අවස්ථා 07ක දී ගිවිසුම් කාලය දීර්ඝ කරමින් එම සැපයුම්කරුටම ටෙන්ඩරය ලබා දී නැවතත් 2024 වර්ෂය දක්වා වූ ටෙන්ඩරය ද එම සමාගමට ප්‍රදානය කර තිබුණි. | | |
| (ඈ) | පැවති කොන්ත්‍රාත්තුව 2015 අප්‍රේල් මාසයේ අවසන් වන බව දැනුවත්ව තිබුණ ද, ඊට අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර තිබුණේ එම කොන්ත්‍රාත් කාලය නිම වී මාස 09 ක් ගත වීමෙන් පසු 2016 පෙබරවාරි මාසයේ දී ය. තවද, 2015 මාර්තු මාසයේ පත්කළ තාක්ෂණික ඇගයීම් කමිටුව, සිය වාර්තාව ඉදිරිපත් කර තිබුණේ මාස 19 කින් පසු 2016 දෙසැම්බර් මාසයේ දී ය. | ප්‍රසම්පාදන කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීම. | පිළිතුරු දී නොතිබුණි. |
| (ඈ) | 2015 වර්ෂයේ අමාත්‍ය මණ්ඩල තීරණයක් පරිදි ආරම්භ කළ නව ප්‍රසම්පාදනයේ පැවැති දෝෂ මත ප්‍රසම්පාදන අභියාචනා කමිටුව විසින් 2017 වර්ෂයේ දී එම ප්‍රසම්පාදනය අවලංගු කර තිබුණි. මේ නිසා සිදු වූ ප්‍රමාදය මාස 24 ක් වූ අතර 2017 වර්ෂයේ අමාත්‍ය මණ්ඩල තීරණයක් පරිදි 2019 අප්‍රේල් මස දී සැපයුම්කරුවෙකු තෝරා ගැනීමට ගතකළ කාලය මාස 24 කි | ප්‍රසම්පාදන කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීම. | පිළිතුරු දී නොතිබුණි. |
| (ඉ) | 2017 ජූනි මාසයේ තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කළ ද, ඔවුන් වෙත ලංසු ලේඛන ලබා දීමට මාස 11ක් ගතකර තිබුණි. එමෙන්ම නව ස්ටිකරයක් ප්‍රසම්පාදනයට ඇතුලත් කළ යුතුද යන්න තීරණය කිරීමට ප්‍රසම්පාදන කමිටුවට මාස 07 ක් ගත වී තිබුණි. | ප්‍රසම්පාදන කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීම. | පිළිතුරු දී නොතිබුණි. |
| (ඊ) | 2019 වර්ෂයේදී එළඹුණු කොන්ත්‍රාත්තුවේ කොන්දේසි අංක 11.2(අ) පරිදි අංක තහඩුවල ගුණාත්මකභාවය පිළිබඳ සහතිකයක් ලබාගෙන නොතිබුණි. තවද, කොන්දේසි අංක 17.1 සහ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 මාර්ගෝපදේශය ප්‍රකාරව රු. මිලියන 200ක් වූ කාර්යසාධන සුරක්ෂණය ඉදිරිපත් කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. එසේම කොන්දේසි අංක 23.1 පරිදි, අපේක්ෂිත හානි සඳහා සම්පූර්ණ රක්ෂණාවරණයක්ද ලබාගෙන නොතිබුණි. | කොන්ත්‍රාත් කොන්දේසිවල ට අනුකූලව කටයුතු කිරීම. | පිළිතුරු දී නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (උ) | රු. මිලියන 4,984ක් වූ මෙම කොන්ත්‍රාත්තුව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.10.2 මාර්ගෝපදේශය අනුව, ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍ය ආයතන වෙබ් අඩවියේ සහ ගැසට් පත්‍රයේ පළ කර නොතිබුණි. තවද, අංක 1704/09 හා 2011 මැයි 04 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රවාහන අමාත්‍යවරයා විසින් නිකුත් කළ 10(v) නියෝගය ප්‍රකාරව අවශ්‍ය විස්තර සහිතව අංක තහඩු මුද්‍රණය කර නොතිබිණි. | නීතිරීති අනුව කටයුතු කිරීම. | පිළිතුරු දී නොතිබුණි. |
| (ඌ) | අවස්ථා 07ක දී මාස 48ක කාලයක් සඳහා කොන්ත්‍රාත්තුවේ දින දීර්ඝ කිරීම් සිදුකර තිබුණද එක් අවස්ථාවක දී හෝ මිල ගණන් සංශෝධන සම්බන්ධයෙන් සාකච්ඡා කර නොතිබුණි. කෙසේ නමුත්, වර්ෂ 09ක කාලයක් තුළ තහඩු මුද්‍රණය කිරීමේ ප්‍රවීනතාව හා හැකියාවත්, යන්ත්‍රසූත්‍ර හා යටිතල පහසුකම් සියල්ල සම්පූර්ණ වීමත් නිසා ගොඩ නැගී තිබුණු ඉතා වාසිසහගත තත්ත්වයක් නිසා සැපයුම්කරු විසින්ම අවම මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව රජයට ලබාගත හැකි ප්‍රතිලාභ අත්කර ගැනීම සඳහා වගකිව යුතු පාර්ශවයන් විසින් ප්‍රමාණවත් මැදිහත් වීමක් සිදුකර ඇති බවක් නිරීක්ෂණය නොවීය. 2015 මැයි 01 දින සිට වසර 04ක් තුළ මුද්‍රණය කළ අංක තහඩු 5,173,526ක් වෙනුවෙන් පෞද්ගලික අංශය වෙත ගලාගිය රාජ්‍ය මුදල් ප්‍රමාණය රු.1,102,929,374 ක් ලෙස නිරීක්ෂණය විය. | හැකි සෑම උත්සාහයක්ම ගෙන රාජ්‍ය මුදල් සුරක්ෂිත කර ගැනීමට කටයුතු කිරීම. | පිළිතුරු ලබා දී නොතිබුණි. |

### 3.2.2 රේඩියෝ තරංග හඳුනාගැනීමේ ටැග් සහිත (RFID/Radio Frequency Identification) ස්ටිකර් සැපයීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | අංක 1704/09 දරන 2011 මැයි 04 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රවාහන අමාත්‍යවරයා නිකුත් කළ 20(I)02 නියෝගය පරිදි වාහනයක ඉදිරිපස වීදුරුවේ ඇතුළත උඩ වම් කෙළවරේ ආදායම් බලපත්‍රයට ඉහළින් ස්ටිකරයක් ඇලවිය යුතු වේ. ඒ අනුව ඉදිරිපස වීදුරුව සහිත වාහන සඳහා පමණක් ස්ටිකරය යෙදිය යුතුවේ. එහෙත් වසර 09ක පමණ කාලයක සිට විධිමත් නෛතික ප්‍රතිපාදන නොමැතිව මෝටර් සයිකල් සඳහාද ස්ටිකරයක් නිකුත් කරන බව නිරීක්ෂණය විය. | අපේක්ෂිත අරමුණු ඉටුවන ආකාරයෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කල යුතු වීම. | පිළිතුරු දී නොතිබුණි. |
| (ආ) | ඉකුත් වර්ෂ 08ක වාහන නව ලියාපදිංචි කිරීම් හා පැවරීම් අනුව, ස්ටිකර්වල වාර්ෂික අවශ්‍යතාවයේ සාමාන්‍ය 918,588 ක් වුවද 2019 මැයි මාසයේ එළැඹ තිබුණු ගිවිසුමට අදාළ ලියවිලි අනුව වාර්ෂික අවශ්‍යතාව ස්ටිකර් 542,000 ක් ලෙස තීරණය කර තිබුණි. එසේම දත්ත කිහිපයක් පමණක් ලබාගත හැකි යන්ත්‍රයක් රු.590,000 කට මිල දී ගැනීමට තීරණය කිරීමද විගණනයේදී ප්‍රශ්නගත කරුණක් විය. | - එම - | - එම - |
| (ඇ) | අවම වශයෙන් කි.මී. 160ක් දක්වා වේගයකින් ගමන් කරන වාහනයක දත්ත අදාළ උපකරණය මගින් කියැවිය යුතු බවට ලංසු ලේඛනවල සඳහන්ව තිබූ අතර දත්ත කියැවිය හැකි හා ලිවිය හැකි දුර පිළිවෙලින් මීටර් 06ක් හා මීටර් 03ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව පැයකට කි.මී. 160ක වේගයකින් ධාවනය වන | - එම - | - එම - |

| | | |
|---|---|---|
| වාහනයක් වෙත මීටර් 06ක් හෝ මීටර් 03ක් තෙක් ආසන්න වීමද විගණනයේදී ප්‍රශ්නගත කරුණක් විය. | | |
| (ඇ) මෙම ස්ටිකරය පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම, වාහනයක යම් නිශ්චිත ස්ථානයක ඇලවිය යුතු බවට නීති සම්පාදනය කිරීම, දත්ත කියවීමේ උපකරණවල උපයෝජනය හා ඒවා භාවිතා කරන්නේ කවුරුන්ද යනාදී කාරණා සම්පූර්ණ කර නොතිබිය දී මෙවැනි ස්ටිකරයක් නිකුත් කිරීම සඳහා දරන පිරිවැයේ ප්‍රායෝගික වටිනාකමද ප්‍රශ්නගත විය. | - එම - | - එම - |

**3.3 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම**

-----------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුව වෙත 2019 ගිණුම් වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 07කට පිළිතුරු 2020 ජූලි 31 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. | විගණන විමසුම් සඳහා අප්‍රමාදව පිළිතුරු ලබා දීම. | පිළිතුරු ලබා දී නොතිබුණි. |

**3.4 කළමනාකරණ දුර්වලතා**

----------------------------

**3.4.1 පැරණි අංක තහඩු අපහරණය**

-----------------------------------

පැරණි අංක තහඩු කාර්මික සංවර්ධන මණ්ඩලයට භාරදෙන ලෙසත්, එසේ නොවන අවස්ථාවලදී තරඟකාරී ලංසු ක්‍රමවේදය මගින් අපහරණය කිරීමට කටයුතු කරන ලෙසත් අමාත්‍ය මණ්ඩල තීරණයක් ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත පරිදි විය.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | වර්ෂ 2016 සිට 2018 අතර කාලය තුළ අබලි අංක තහඩු විකිණීමෙන් කාර්මික සංවර්ධන මණ්ඩලය උපයා ඇති ශුද්ධ ලාභය රු. 3,485,325ක් විය. එය මෙම කාර්යය සෘජු ව ඉටු නොකිරීම නිසා දෙපාර්තමේන්තුවට අහිමි වූ ආදායමක් විය. | අහිමි වන ආදායම් පිළිබඳව අදාළ පාර්ශව දැනුවත් කිරීම. | අමාත්‍ය මණ්ඩල තීරණය, සාධාරණ මිලකට තහඩු ලබාදීම වේ. |
| (ආ) | අබලි අංක තහඩු කි.ග්‍රෑ. 26980ක් සඳහා වූ රු. 1,981,141ක මුදල කාර්මික සංවර්ධන මණ්ඩලයෙන් ලද බවට තහවුරු නොවීය. | ආදායම් කඩිනමින් එකතු කර ගැනීම. | පිළිතුරු ලබා දී නොතිබුණි. |
| (ඇ) | කාර්මික සංවර්ධන මණ්ඩලය මගින් නිකුත් කළ අබලි ලෝහ කළමනාකරණය පිළිබඳ මාර්ගෝපදේශ පරිදි අතරමැදියන්ගේ ග්‍රහණය නිසා කුඩා හා මධ්‍ය පරිමාන කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන පිරිවැය ඉහළ ගොස් ඇති බව වාර්තා කර තිබුණි. කාර්මික සංවර්ධන මණ්ඩලය හා එකඟ වූ මිලට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් අදාළ නිපැයුම්කරුවන්ට සෘජුව එම අබලි ද්‍රව්‍ය ලබාදුන්නේ නම්, ඔවුන්ට ඇති වන ලාභය කිලෝ ග්‍රෑම් 01ක් සඳහා රු.27.82 ක් බව නිරීක්ෂණය විය. | යම් කාර්යයක් ආරම්භ කර පවත්වා ගෙන යාමේදී පැන නැගෙන අයහපත් දෑ පිළිබඳ අදාළ පාර්ශව දැනුවත් කිරීම. | අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මිල කමිටුව රැස් වී තහඩු කි.ග්‍රෑම් 01 ක මිල රු.73.43ක් ලෙස තීරණය කර තිබුණි. |

## 3.5 දෘශ්‍ය අක්‍රමිකතා

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | වාහනයක් සොරාගත් බවට අයිතිකරු විසින් 2004 වර්ෂයේදී දෙපාර්තමේන්තුව වෙත විධිමත්ව දන්වා | නීතිරීතිවලට අනුකූලව | පරම අයිතිය ලියාපදිංචි කරන |

| | | | |
|---|---|---|---|
| | තිබුණද, ඉන් වසර 13කට පසු 2017 වර්ෂයේදී එම වාහනය වෙනත් අයෙකුගේ නමට ලියාපදිංචි කර තිබූ අතර මේ පිළිබඳ විරෝධතාවක් ද පරිගණක ගතකර තිබුණි. තවද, වාහනයේ පරම අයිතිකරු විසින් සිය අයිතිය ලියාපදිංචි කරන ලෙස 2004 ජූලි මාසයේදී ලිඛිත ව දන්වා තිබුණ ද, එය ඉටුකර තිබූ බවක් නිරීක්ෂණය නොවුණි. වාහනයේ ලියාපදිංචි සහතිකයේ මුල් පිටපත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සතු ව පැවතිය දී මෝටර් වාහන පනතේ 14(1)(අ) වගන්තියට අනුකූල නොවන ලෙස මෙම පැවරුම ලියාපදිංචි කර තිබුණි. මෙම වාහනය සඳහා 1998 වර්ෂයේ සිට වර්ෂ 20ක් සඳහා 2017 වර්ෂයේදී රු.158,025ක් එක්වර ගෙවා ලබාගත් ආදායම් බලපත්‍රයක් මත මෙම පැවරීම සිදුකර තිබුණු අතර එය මතභේදයට තුඩුදෙන කරුණක් විය. මෝටර් වාහන පනතේ 25(1) වගන්තිය අනුව ආදායම් බලපත්‍රයක් නොමැතිව වාහනයක් සන්තකයෙහි තබාගැනීම පිළිබඳ ලසු පරීක්ෂණයක්ද සිදුකර ඇති බවක් නිරීක්ෂනය නොවුණි. | කටයුතු කළ යුතු වීම හා මේ පිළිබඳව විමර්ශනයක් සිදුකර අදාල පාර්ශවයන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගත යුතුවීම. | ලෙස 2004 ජූලි මාසයේදී දන්වා තිබුණි. පැවරුම් ලේඛනද බැලූබැල්මට නිවැරදි ය. අගතියට පත් පාර්ශවයට නඩු පැවරිය හැකිවන අතර හිඟ බලපත්‍ර ගාස්තු ගෙවීමෙන් පසු පැවරීම සිදුකර ඇත. |
| **(ආ)** | පැවරීමේ ලේඛන ගැටළුසහගත බැවින් මිට්සුබිෂි මොන්ටෙරෝ වර්ගයේ ජීප් රථයක පැවරීම අත්හිටුවන ලෙස බස්නාහිර පළාත් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් දන්වා තිබුණි. 2003 වර්ෂයේ පළමු ලියාපදිංචියේ සිට 2019 වර්ෂය දක්වාම මෙම වාහනයේ අයිතිකරු ලෙස බස්නාහිර පළාත් මෝටර් රථ දෙපාර්තමේන්තුව හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් එකිනෙකට වෙනස් පුද්ගලයන් දෙදෙනෙකු පිළිගෙන තිබුණු අතර 2018 වර්ෂයේ දින 08ක් සඳහා බලපත්‍ර ගාස්තු ගෙවා තිබුණි. එමෙන්ම, මෝටර් වාහන පනතේ 25(1) වගන්තියට පටහැනිව, ආදායම් බලපත්‍රයක් නොමැතිව වර්ෂ 15ක් වාහනය සන්තකයේ තබාගෙන තිබීම නිසාත් වාහනය සඳහා රේගු සබඳතාවක් (Custom Link) නොමැතිවීම හේතුවෙන් වැසි අංකය පිළිබඳ තොරතුරු නොමැති | වාහනයේ ලියාපදිංචි අයිතිය තහවුරු කර ගැනීම සඳහා විමර්ශනයක් කළ යුතු වීම හා අදාල පාර්ශව සම්බන්ධයෙන් විධිමත් පියවර ගත යුතුවීම. | මුල් ගොනුව මේ වන තුරු ලේඛනාගාරයෙන් ලැබී නැත. බස්නාහිර පළාත් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්ගෙන් විමසා බැලිය යුතු අතර මෙම වාහනයේ දත්ත රේගු දෙපාර්තමේන්තු මගින් සම්ප්‍රේෂණය වී |

| | | | |
|---|---|---|---|
| | වීම නිසාත් මෙය නීති විරෝධී ලෙස එකලස් කර හෝ ආනයනය කර පසුව පරිගණක පද්ධතියට ඇතුළත් කළ වාහනයක්ද යන්න සනාථ කරගත නොහැකි විය. තවද, මෙම වාහනය සඳහා නොගෙවූ සුඛෝපභෝගී බදු මුදල රු.757,500කි. | | නොමැත. එමෙන්ම සියලු බදු මුදල් ගෙවා ඇත. |
| **(ඇ)** | චීනයේ නිෂ්පාදිත CEYGRA වර්ගයේ ත්‍රීරෝද කාරයක ලියාපදිංචි අංකය හා දිනය හැර අනෙකුත් තොරතුරු පරිගණක පද්ධතියෙන් ඉවත් කර එම අංකයට බ්‍රිතාන්‍යයේ නිෂ්පාදිත MINI COOPER වර්ගයේ මෝටර් කාරයක් ලියාපදිංචි කර තිබුණු බව නිරීක්ෂණය විය. | වාහන ලියාපදිංචි කිරීමේ නිවැරදිතාව සඳහා විමර්ශනයක් කළ යුතු වීම හා අක්‍රමිකතාවයන් සිදු වී ඇතිනම් ඒ සඳහා විධිමත් පියවර ගත යුතු වීම. | පිළිතුරු ලබා දී නොතිබුණි. |
| **(ඈ)** | ෆර්ජෝ 504 වර්ගයේ මෝටර් කාරයක් වෙනුවෙන් පරිගණක පද්ධතියේ පැවැති තොරතුරු ඉවත් කර එම ලියාපදිංචි අංකය යටතේ මිට්සුබිෂි පෙජරෝ ජීප් රථයක් ලියාපදිංචි කර තිබුණු බව නිරීක්ෂණය විය. | මෙම වාහනය ලියාපදිංචි කිරීමේ නිවැරදිතාව තහවුරු කර ගැනීම සඳහා ස්වාධීන විමර්ශනයක් කළ යුතු වීම. | පැහැදිලි පිළිතුරක් ලබා දී නොතිබුණි. |

## 3.6 අවිධිමත් ගනුදෙනු

--------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ආදායම් විෂයයන් 05 ක් යටතේ 2018 වර්ෂයේ සිට 2020 පෙබරවාරි මාසය දක්වා රු. 488,898,050ක ආදායමක් උපයා තිබුණද ඒ සඳහා අංක 01/2015 හා 2015 ජූලි 20 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ උපදෙස් අනුගමනය කර නොතිබුණි. | ආදායම් එකතු කිරීම සඳහා අප්‍රමාදව නීති අනුමත කර ගැනීම. | පිළිතුරු ලබා දී නොතිබුණි. |
| (ආ) | වාහන ලියාපදිංචිය පිළිබඳ දූරකථන කෙටි පණිවුඩ සේවාව (SMS) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 මාර්ගෝපදේශය ප්‍රකාරව විවෘත මිල කැඳවීමක් නොමැතිව පවරා තිබුණි. එම ප්‍රසම්පාදනයට නිර්දේශය ලබාදුන් තාක්ෂණික ඇගයීම් කමිටුවේ සංයුතිය, එහි සාමාජිකයෙකු විසින්ම යෝජනා කර තිබුණු අතර එය කොමසාරිස් ජනරාල්වරයා අනුමත කර තිබුණි. කෙසේ නමුත්, මෙම මෘදුකාංගය අක්‍රීය වී තිබුණු අතර එය නැවත සක්‍රීය නොකරන්නේ නම්, ඒ වෙනුවෙන් දරන ලද රු. 2,160,000 ක මුදල නිෂ්ඵල බව නිරීක්ෂණය විය. | නීතිරීති අනුව අනුව කටයුතු කිරීම හා නැවන සේවාව සක්‍රීය කළ යුතු වීම. | වෙනම සර්වර් යන්ත්‍රයක මෙම සේවාව ස්ථාපිත කිරීමට කටයුතු කෙරේ. |

## 3.7 පොදු කරුණු

--------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------ | --------------- | ------------------------------ |
| (අ) එක් දිනයක් තුළ ලියාපදිංචි සහතිකයට සංශෝධන කිහිපයක් සිදුකළ විට, පළමු වෙනස් කිරීම පමණක් සටහන් වී ඊට පසු සිදුකළ සංශෝධන සටහන් නොවී පවතින බව නිරීක්ෂණය විය. මේ අනුව පළමු සංශෝධනයේදී වාහනයේ වර්ණය, ලිපිනය වැනි සුළු වෙනස්කමක් පමණක් සිදුකර, දෙවනුව චැසි අංකය වැනි දත්ත ඉවත්කර නව දත්ත පද්ධතියට ඇතුළත් කිරීමට ඉඩ සැලසී ඇති බවක් නිරීක්ෂණය විය. තවද, ලියාපදිංචි අයිතිය පැවරීමෙන් පසුව ලියාපදිංචි සහතිකයේ සංශෝධන සඳහා ඉදිරිපත් කර තිබුණු අයදුම්පත් සියල්ල පූර්ව අයිතිකරුගේ නමින් තිබීමත් පැරණි වාහනවලට අදාළ රේගු සටහන්කර පිළිබඳ තොරතුරු පරිගණක පද්ධතියේ නොතිබීමත් නිසා මෙරට දී එකලස් කරන ලද හෝ නීති විරෝධී ලෙස මෙරටට ගෙන්වන ලද වාහන සාවද්‍ය ලෙස ලියාපදිංචි කිරීමට ඉඩකඩ ලැබී ඇතැයි යන සැකය විගණනයේදී බැහැර කල නොහැකි විය. | අක්‍රමිකතා ඇති නොවන පරිදි මනා අභ්‍යන්තර පාලනයක් ඇති කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. | රේගු දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතිය හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතිය සමඟ ස්වයංක්‍රීයව සම්ප්‍රේෂණය කර ඇත්තේ 2003 වර්ෂයේ සිට වුවද, එමඟින් සියලු වාහනවල තොරතුරු සම්ප්‍රේෂණය කර ගැනීමට නොහැකි වී ඇත. |
| (ආ) පරිගණක පද්ධතිය මඟින් සිදු කරන වාහන අසාධු ලේඛනගත කිරීමේ කාර්යය අභ්‍යන්තර විගණන හා විමර්ශන අංශය වෙත ද, ඒවා ඉවත් කිරීමේ කාර්යය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කොමසාරිස්වරයාට ද පවරා තිබුණු නමුත්, වෙනත් නිලධාරීන් විසින් ද එම කාර්යය සිදුකර තිබුණි. එමෙන්ම, වාහන පැවරුම් අංශවල අධීක්ෂණ නිලධාරීන්ට විමර්ශන අංශයට පමණක් හිමි බලතල පවරා දී තිබුණි. | මනා අභ්‍යන්තර පාලනයක් ඇති කිරීම. | පිළිතුරු ලබා දී නොතිබුණි. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනතේ 3.6, 3.9, 11.2 සහ 11.6 යන අරමුණු ලඟාකර ගැනීම උදෙසා සිය සම්පත් කාර්යක්ෂමව මෙහෙයවිය යුතු නමුත් මේ දක්වා එකී අරමුණු හඳුනාගෙන ඒවා ඉටුකර ගැනීමට අදාළ වැඩසටහන් සකස් කර නොතිබුණි. | පනතේ විධිවිධාන පරිදි කටයුතු කිරීම. | පිළිතුරු ලබා දී නොතිබුණි. |

## 5. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එක් නිලධාරියෙකු විසින් 2019 වර්ෂය තුළ වැඩකළ යුතු දින 183කින් දින 137 ½ ක් රාජකාරි නිවාඩු ලෙස දන්වා කාර්යාලයෙන් බැහැර ව ගතකර තිබුණි. 2019 පළමු කාර්තුව තුළ ලබාගත් රාජකාරි නිවාඩු සඳහා කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමැතිය තිබුණ ද, ඉතිරි කාලය වෙනුවෙන් කිසිදු අනුමැතියක් නොතිබුණි. මෙවැනි නිවාඩු ලබා ගැනීමට පෙර ඉටු කරන රාජකාරිය පිළිබඳ සලකා බලා නිවාඩු අනුමත කිරීමේ පිළිවෙතක් නොතිබුණු අතර මෙම නිවාඩු කිසිවක් ආයතන සංග්‍රහයේ xii වැනි පරිච්ඡේදයේ 13 වගන්තියට අනුකූල නොවීය. | නීති,රීති හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීම | පිළිතුරු ලබා දී නොතිබුණි. |